# 08 ජීවීන්ගේ ලාක්ෂණික

10 ශ්‍රේණිය - විද්‍යාව - 3වන සතිය

ඔබේ පෙළපොතෙහි “ජීවීන්ගේ ලාක්ෂණික” පාඩම (8වන පාඩම) හොඳින් අධ්‍යයනය කර පහත ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන්න.

01. ජීවීන්ට පොදු ලාක්ෂණික 8ක් සඳහන් කරන්න.

02. ඔබ විසින් ඉහත දැක්වූ ජීවීන් ගේ ලාක්ෂණික සඳහා ඔබ දකින උදාහරණ දෙක බැගින් දෙන්න.

03. පටකයක් සතු ලක්ෂණ දෙකක් ලියන්න.

04. ජීවී දේහයේ සංවිධාන මට්ටම් සඳහා උදාහරණ සපයන්න.

05. ප්‍රභාසංශ්ලේශණ ක්‍රියාවලිය රූප සටහනකින් නිරූපණය කරන්න.

06. ප්‍රභාසංස්ලේෂණ ක්‍රියාවලිය සඳහා අදාළ වචන සමීකරණය හා තුලිත රසායනික සමීකරණය මතකයෙන් ලියන්න.

07. i) ශ්වසනය සඳහා ඔක්සිජන් වායුව අවශ්‍ය බව පරීක්ෂා කිරීම සඳහා සුදුසු ක්‍රියාකාරකමක ඇටවුම ඇඳ, පියවර ලියා දක්වන්න.
ii) මෙම ක්‍රියාකාරකම මගින් ලැබෙන නිරීක්ෂණ සඳහන් කර ඒවාට හේතු පැහැදිලි කරන්න.

08. i) ශ්වසනයේ දී කාබන් ඩයොක්සයිඩ් වායුව නිදහස් වන බව පෙන්වීමට සිදුකරන විද්‍යාගාර ක්‍රියාකාරකමක ඇටවුම ඇඳ කොටස් නම් කරන්න.
ii) මෙම ක්‍රියාකාරකම සඳහා KOH හා $Ca(OH)_2$ යෙදීමෙහි අරමුණු වෙන වෙනම පැහැදිලි කරන්න.
iii) මෙහි දී අපේක්ෂා කරන නිරීක්ෂණ සඳහන් කර ඒවා සඳහා හේතු දක්වන්න.
iv) මෙම ඇටවුමට යෙදිය හැකි වෙනත් ජීවී ආකාරයක් සඳහන් කරන්න.

09. ශාක චලන සඳහා නිදසුන් තුනක් දක්වන්න.

10. වෘද්ධිමාන ඇටවුමක් ඇඳ ඒ මගින් ශාකයක වර්ධනය පිළිබඳ නිරීක්ෂණ ගන්නා අයුරු සඳහන් කරන්න.

11. පහත දක්වා ඇති සංසිද්ධි සඳහා ගැළපෙන ජීවී ලාක්ෂණිකය හිස්තැනට යොදන්න.

| සංසිද්ධිය | ජීවී ලාක්ෂණිකය |
|---|---|
| ජීවියෙකු තම පැවැත්මට නව පරම්පරාවක් බිහිකිරීම. | |
| මත්ස්‍යයින්ට කරමල් තිබීම. | |
| ශාකයක මුල් ගුරුත්වය දෙසට වැඩීම. | |
| අප සිරුරෙන් දහඩිය පිටවීම. | |
| උණුසුම් ද්‍රව්‍යයක අත ගැටුණු විට අප විසින් ක්ෂණිකව අත ඉවතට ගැනීම. | |
| සෛල තුළදී සංචිත ආහාර මගින් ශක්තිය නිපදවීම. | |
| ප්‍රභාසංස්ලේෂණය | |
| උසස් බහු සෛලික ජීවීන් තුළ පටක හා පද්ධති මට්ටමේ සංවිධානයක් තිබීම. | |

සැකසුම - D. ඥානරත්න හා W.G.D.K. වත්තෙගෙදර - දෙහිඕවිට අධ්‍යාපන කලාපය